SINHALI

# ඉස්ලාමයේ ප්‍රධාන පාඩම්


අශ්ශෙයික්
අබ්දුල් අසීස් බින් අබ්දුල්ලාහ් බින් බාස්
(රහිම හුල්ලාහ්)



සිංහල අනුවාදය
මොහම්මද් නලීම් ඉස්සදීන්



مركز العناية بالمسلمين الجدد
CARE CENTER FOR NEW MUSLIMS

# ඉස්ලාමයේ ප්‍රධාන පාඩම්

අශ්ශෙයික්

අබ්දුල් අසීස් බින් අබ්දුල්ලාහ් බින් බාස්

(රහිම හුල්ලාහ්)

සිංහල අනුවාදය

මොහම්මද් නලීම් ඉස්සදීන්

නව මුස්ලිම්වරුන්ගේ භාරකාර මධ්‍යස්ථානය

## بسم الله الرحمن الرحيم

## පෙරවදන

සියලු පැසසුම් ඒකීය අල්ලාහ් සතුවේ. අවසාන නබි සහ එතුමන්ගේ පවුලේ සියලු දෙනා හා හිතවතුන් වෙත අල්ලාහ්ගේ මෛත්‍රිය හා ශාන්තිය පුද වේවා!

මබේ දෝතට ලැබී ඇති මෙම පොත් පිංච ඉස්ලාම් සම්බන්ධව පොදුජනයා විසින් දැනගත යුතු කරුණු පිළිපද සංෂිප්ත විස්තරයයි. මෙම කෘතිය "ආධුනිකයන් සඳහා විශේෂ පාඩම්" යන නමින් ප්‍රකාශයට පත් කරමි.

මෙම කෘතිය තුලින් ජනයාට සෙතක්ම වේවා! මගේ මෙම කර්තව්‍ය අල්ලාහ් පිළිගනිත්වා! යනු මගේ ප්‍රාර්ථනයයි.

**අබ්දුල් අසීස් බින් අබ්දුල්ලා බින් බාස්**

بسم الله الرحمن الرحيم

සියළු ප්‍රශංසා අල්ලාහ් තආලාටම හිමිය. අපි මහු ප්‍රශංසා කරමු, මහුගෙන් උදව් උපකාර හා අපේ වැරදි සඳහා සමාව අයද සිටිමු. අපේම නපුරු සිතුවිලි සහ කෲර ක්‍රියා සඳහා ශ්‍රේෂ්ඨ වූ අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතමු.

විශ්වාස වන්තයිනි (අල්ලාහ් අණකළ දේ කිරීමෙන්ද වළක්වන දෙයින් වැළකී සිටීමෙන්ද) අල්ලාහ්ට බියවිය යුතු ආකාරයට බියවන්න. (අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම යටහත්භාවය දැක්වීම තුලින්) ඉස්ලාමිකයෙකු වශයෙන් මිස මරණයට පත් නොවන්න. (අල්කුර්ආන් 3 : 102)

මනුෂ්‍යයිනි අල්ලාහ් උදෙසා මබේ යුතුකම් ඉටුකරන්න, මහු[1] එකම මනුෂ්‍යයෙකු (ආදම්)

---

[1] අර් රබ් යනු සියල්ල පාලනය කරන්නාය. විශ්වයේ ඇති සියල්ලක්ම ඇති වීමට සහ එහි පැවැත්මටද ඒවායේ ගැවැසීමට හා වෙනස්වීමටද බලය ලබා දුන්නේ අල්ලාහ් විසින්ය. සියළු මැවීම් මහු සතුය. සියල්ලහි ස්වාමියාවූ මහුගේ බලවික්‍රමයට කිසිවක් හා කිසිවකුට සමාන වීමට නොහැක. විශ්වයට අවශ්‍ය සියල්ල සපයන්නා සහ පරිපාලනය කරන්නා මහුය.

ගෙන් ඔබ නිර්මාණය[2] කළේය. ඔහුගෙන් (ආදම්ගෙන්) ඔහුගේ බිරිඳ නිර්මාණය කළේය. ඔවුන් දෙදෙනාගෙන් අනන්තවත් ගැහැණුන් සහ පිරිමින් නිර්මාණය කළේය. ඔබේ කිට්ටු ඥාතීන් හා ඔබේ කටයුතු ගැන ප්‍රශ්න කරනු ලබන අල්ලාහ් තආට බියවන්න. ඔබේ කටයුතු සම්බන්ධයෙන් අල්ලාහ් සුපරීක්ෂාකාරීව සිටින්නේය. (අල්කුර්ආන් 4 : 1)

විශ්වාස වන්තයිනි! අල්ලාහ් උදෙසා ඔබේ යුතුකම් නිසියාකාරව ඉටුකරන්න. තවද සත්‍ය කතා කරන්න, ඔහු ඔබට යහපත් මාර්ගය කොරෙහි මග පෙන්වයි. තවද ඔබේ වැරදි සඳහා සමාව දෙයි. තවද කෙනෙකු අල්ලාහ් සහ ඔහුගේ පණිවිඩකරුවා අනුගමනය කරන්නේද ඔහු උසස් වූ ජයග්‍රාහනය අත්පත් කරගන්නේය. (අල්කුර්ආන් 33 : 70 - 71)

සත්‍ය වූ අනුශාසනය අල්ලාහ්ගේ ග්‍රන්ථය වූ ශුද්ධවූ අල්කුර්ආනයයි. උත්තරීතරවූ මගපෙන්වීම මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ මගපෙන්වීමයි. ප්‍රබල අයහපත බිද්අත් හෙවත් අනියම් ලෙස ඉස්ලාමයට ඇතුලත් කරන ලද ඒවා වේ.

මෙය සෑම මුස්ලිම්වරයෙකුටම උචිත වූ ඉස්ලාමය කෙටියෙන් හඳුන්වා දීමේ පොත් පිංචකි. මෙහි වන්දනාමාන ක්‍රම හා මූලික විශ්වාසයන් පිළිබඳ සංක්ෂිප්තව පැහැදිලි කරදී ඇත.

මෙම පොත් පිංච සම්පාදනය කිරීමේ කර්තව්‍ය පිලිගන්නා ලෙසත් මෙය කියවන පාඨකයන් හට ප්‍රයෝජනයක් ලබා දෙන ලෙසටත් අති විශිෂ්ඨ වූ අල්ලාහ්ගේ නාමයන්ගෙන් ඉල්ලා සිටිමි.

**කාලිඩ් අල් අවාඩ් සහ අවාය් සාලිහ් අස් සාලිහ්**

**24/2/1413**

**8/12/1993**

# ඉස්ලාමයේ වැදගත් පාඩම්

**පාඩම් අංක : 1**

## සූරතුල් ෆාතිහා සහ කෙටි පරිච්ඡේද කිහිපයක් පාඩම් කිරීම

සෑම මුස්ලිමෙකු විසින්ම සූරතුල් ෆාතිහා පරිච්ඡේදය ධාරනය කර ගැනීමට හා මනාව කියවීමට පුරුදු පුහුණු විය යුතුයි. මීට අමතරව අවම වශයෙන් සූරත් සිල්සලාහ් සිට සූරතුන් නාස් දක්වා කෙටි පරිච්ඡේද කිහිපයක් පාඩම් කර ගැනීම වැදගත් වේ.

**පාඩම් අංක : 2**

## ඉස්ලාමයේ ප්‍රධාන වගකීම් පහ

ඉස්ලාමයේ ප්‍රධාන වගකීම් පහක් ඇත. මේ අතුරින් මූලික හා ප්‍රධාන වගකීම නැමඳුමට අල්ලාහ් තආලා හැර වෙන දෙවියෙකු නැත, මුහම්මද් නබි (සල්) තුමාණන් අල්ලාහ් තආලාගේ

පණිවිඩ කරුවෙකු වේ. යනුවෙන් සාක්ෂි දැරීමේ පාඨය කොන්දේසි සහිත විස්තර කිරීමයි.

ෂහාදා ප්‍රකාශයේ අර්ථය : (ලාඉලාහ) අල්ලාහ් තආලා හැර ලොවෙහි පවතින සියළු දෙව් දේවතාවන් ප්‍රතික්ෂේප කිරීම. (ඉල්ලල්ලාහ්) සියළු වැඳුම් පිදුම් අල්ලාහ්ට පමණක් ඉටු කර මහුගේ බල මහිමයට කිසිවක් සමාන නොකර මහු පරිශුද්ධත්වයට පත් කිරීම.

“ලාඉලාහ ඉල්ලල්ලාහ් ” යනුවෙන් සාක්ෂි දැරීම කොන්දේසි හතකින් සමන්විතය. ඒවානම් :-

1. “අල් ඉල්ම්” ඥානය මෙහි විරුද්ධ අදහස නම් අවිද්‍යාවයි.

2. “යකීන්” නිසැකව ස්තිරව සිටීම. මෙහි විරුද්ධ අදහස සැක සිතීමයි.

3. “අල් ඉඛ්ලාස්” යනු අවංකකමයි. මෙහි විරුද්ධ අදහස වංකභාවයයි.

4. “ අස් සිද්ක් ” යනු සත්‍යවන්ත කමයි. මෙහි විරුද්ධ පදය අසත්‍ය බවයි.

5. " මහබ්බත් " ආදරය දැක්වීම. මෙහි විරුද්ධ අදහස පිළිකුල් කිරීමයි.

6. "අල් ඉන්කියාද්" යටහත් භාවය දැක්වීම. මෙහි විරුද්ධ අදහස අකීකරු වීමයි.

7. " අල් කබූල් " යනු පිළිගැනීමයි. මෙහි විරුද්ධ අදහස ප්‍රතික්ෂේප කිරීමයි.

**පාඩම අංක : 3**

## <u>විශ්වාස කළයුතු මූලික කරුණු හය</u>

ඊමාන් හෙවත් විශ්වාසයේ කුළුණු හය : එනම්

1. අල්ලාහ් ගැන විශ්වාස කිරීම,
2. අල්ලාහ්ගේ මලාඉකාවරුන් ගැන විශ්වාස කිරීම.
3. අල්ලාහ්ගේ පුස්තකයන් ගැන විශ්වාස කිරීම.
4. අල්ලාහ්ගේ රසූල්වරුන් ගැන විශ්වාස කිරීම.
5. අවසාන දිනය ගැන විශ්වාස කිරීම.
6. අල්ලාහ්ගේ පූර්ව සැළැස්ම අනුව යහපත් හෝ අයහපත් සිදුවීම් සියල්ලක්ම සිදුවන බවට විශ්වාස කිරීම.

**පාඩම අංක : 4**

## තව්හීද් වර්ග සහ ශිර්ක් වර්ග

තව්හීද් වර්ග තුනකි. 1. තව්හීද් අර් රුබූබිය්යා 2. තව්හීද්අල් උලූහිය්යා. 3. තව්හීද් අස්මාඋස් සිෆාත්.

1. “රුබූබිය්යත්” හෙවත් මවා පෝෂණය කරන සංකල්පය. එනම් විශ්වයේ ඇති සියළු දෙය මවා පෝෂණයකරන ආරක්ෂකයාත් සියල්ල පරිපාලනය කරන්නාත් අල්ලාහ් පමණක්ය. ඔහුගේ බල මහිමයට සමාන කිසිවක් නැත. යන සංකල්පය කෙරෙහි ඊමාන් විශ්වාස පිහිටුවීම.

2. “උලූහිය්යත්” හෙවත් වන්දනාමාන වතාවත් පිළිබඳ ඒකත්ව සංකල්පය. එනම් සත්‍ය වශයෙන්ම නැමදුමට සුදුසු දෙවියා අල්ලාහ් පමණි. වන්දනාමාන වතාවත්හි අල්ලාහ්ට සමාන කිසිවක් හෝ කිසිවෙක් නැත. “ලාඉලාහ ඉල්ලල්ලාහ්” යන්නෙහි අර්ථයද මෙයයි. සත්‍යවශයෙන්ම වැඳුම් පිදුම් ලැබීමට අල්ලාහ් හැර වෙන කිසිවෙකු නැත. සලාත් සව්ම් වැනි

සියළුම වන්දනාමාන පවිත්‍ර චේතනාව මුල්කර ගෙන අල්ලාහ්ට පමණක් ඉටු කළ යුතුවේ. මෙම වන්දනාමාන ක්‍රම අතුරින් කිසිවක් වෙනත් කෙනෙකුට පිදීමට නොහැක.

3. අල්ලාහ්ගේ "අස්මාඋල් හුස්නා වස් සිෆාත්" අලංකාර නාම හා සර්ව සම්පූර්ණ ගුණාංග පිළිබඳ සංකල්පය.

ශුද්ධ වූ අල්කුර්ආනයෙහි සහ අල් හදීස්හි සඳහන් අල්ලාහ්ගේ අලංකාර නාම හා සම්පූර්ණ ගුණාංග සියල්ලක්ම කෙරෙහි විශ්වාසය පිහිටුවා ඒවා අල්ලාහ්ට සුදුසු ආකාරයට ස්ථාවර කිරීම.

**අල්ලාහ්ට සමාන තැබීමේ මාර්ග තුනකි :**

මහා ෂිර්ක්, කුඩා ෂිර්ක්, සැඟැවුනු ෂිර්ක් යනුවෙන් ෂිර්ක් වර්ග තුනක් ඇත. ඒවා පහත සඳහන් ආකාරයට විස්තර කරමු.

1. අෂ් ෂිර්කුල් අක්බර් හෙවත් මහා ෂිර්ක්

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කෙනෙකුගේ සියළු යහ ක්‍රියා නිෂ්ඵල වේ. ඔහුට සදාකාලිකව නිරයේ වාසය කිරීමට සිදුවේ. අල්කුර්ආනයෙන් සාක්ෂි :

(ولو أشركوا لحبط عنهم ما كانوا يعلمون) الأنعام ٨٨

ඔවුහු (අල්ලාහ්ගේ බලයට) සමාන තැබූ බැවින් ඔවුන් කරමින් සිටි සියළු යහ ක්‍රියා විනාශයට පත් විය. (අල් අන්ආම් 88)

( ما كان المشركين أن يعمروا مساجد الله شاهدين على انفسهم بالكفر أولئك حبطت أعمالهم وفي النار هم فيها خالدون) التوبة : ١٧

විශ්වාස නොකරන බවට තමන් විසින්ම සාක්ෂි දරමින් අල්ලාහ්ගේ නැමදුම් ස්ථාන පරිපාලනය කිරීමට සමාන තබන්නන්ට අයිතියක් නැත. ඔවුන්ගේ ක්‍රියා නිෂ්ඵල කරනු ලැබේ. ඔවුහු නිරයෙහි සදාකල් වෙසෙති. (9:17)

( إن الله لا يغفر أن يشرك به ويغفر ما دون ذلك لمن يشاء ) النساء ٤٨

අල්ලාහ් (ගේ බලමහිමය) ට හවුල් කරුවන් ඇති කරන්නාට අල්ලාහ් සමාව නොදෙයි. එය හැර වෙනත් වැරදි සම්බන්ධයෙන් ඔහු කැමති අයට සමාව දෙයි. (4 : 16)

( إنه من يشرك بالله فقد حرم الله عليه الجنة ومأواه النار وما للظالمين من أنصار) المائدة ٧٢

නියත වශයෙන්ම අල්ලාහ් (ගේ බල මහිමයට) හවුල් කරුවෙකු පත් කරන්නේ කවරෙක්ද අල්ලාහ් ඔහුට ස්වර්ගය තහනම් කරයි. ඔහු සඳා වාසය කරන ස්ථානය නිරයයි. අපරාධකරුවන්ට සහකරුවන් කිසිවෙකු නැත. (5:72)

මහා ෂිර්ක් වර්ගයට පහත සඳහන් නැමැදුම් ක්‍රමද ඇතුලත් වේ. එනම්: මළවුන් හා පිළිම අභියස සිය අවශ්‍යතා සඳහා ප්‍රාර්ථනය කිරීම. උදව් පැතීම හා භාරහාර වීම. සතුන් ඝාතනය කර පූජා කිරීම.

## 2. අෂ් ෂිර්ක් අස්ගර් හෙවත් කුඩා ෂිර්ක්

මෙම ෂිර්ක් සඳහා අල්කුර්ආනයේ සහ අල් හදීසයේ සාධක ඇත. නමුත් මෙම ෂිර්ක් වර්ගය පළමුව සඳහන් කළ ෂිර්ක් තත්ත්වය මෙන් දරුණු නැත.

අෂ් ෂිර්ක් අස්ගර් සඳහා උදාහරන: සමහර ක්‍රියාවන් අනුන් පිනවීම සඳහා (මුනිච්චාවට) කිරීම, අල්ලාහ් හැර වෙනත් අයගේ නාමය මත දිවුරුම් දීම, තවද මේ සම්බන්ධයෙන්

මුහම්මද් නබි (සල්) තුමාගේ ප්‍රකාශය පහත සඳහන් වේ.

(ඔබලා විසින්) කුඩා ෂිර්ක් (කිරීම) කෙරෙහි භිය වෙමි. යැයි වරක් නබි (සල්) තුමාණන් පැවැසූහ. කුඩා ෂිර්ක් යනු කිමදැයි අසනු ලැබූ විට එය "මුහිච්චාවට" (ව්‍යාජ ලෙස අනුන්ගේ ප්‍රසාදය ලබා ගැනීම සඳහා) කරන ක්‍රියාවක් බව නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළහ. (ඉමාම් අහ්මද් වාර්තා කරයි)

අල්ලාහ් හැර වෙන කිසිවෙක් හෝ කිසිවක් මත දිව්රුම් කරන්නා අල්ලාහ්ගේ බලයට සමාන තබන්නෙකු වේ. යැයි මුහම්මද් නබි (සල්) තුමාණන් දේශණාකළහ. (ග්‍රන්ථය: අබූදාවූද්)

අල්ලාහ්ගේ සහ අසවල් පුද්ගලයාගේ කැමැත්ත අනුව සිදුවේ. යැයි නොපවසන්න. මෙසේ පවසන්න. එනම් අල්ලාහ්ගේ විධානය පරිදි අසවල් පුද්ගලයාගේ කැමැත්ත සිදුවේ යනුවෙන් පවසන්න. (ග්‍රන්ථය:අබූ දාවූද්)

කුඩා ෂිර්ක් තත්ත්වය නිසා කෙනෙකු ඉස්ලාම් සීමාවෙන් බැහැර නොවන අතර

සදා කල් අපායේ වේදනාවටද ලක් නොවේ. එනමුත් ඔහු තව්හීද් සීමාවට සම්පූර්ණයෙන්ම ඇතුල්වූකෙනෙකුගේ තත්ත්වයට පත් නොවේ.

**3.** සැඟවුනු ෂිර්ක්. මෙම ෂිර්ක් වර්ගය සඳහා අල් හදීසයෙන් සාක්ෂි :

මසීහුද් දජ්ජාල්ගෙන් ඔබලාට සිදුවන උවදුරට වඩා වැඩියෙන් මා බිය වන දෙයක් ගැන පවසන්නද? යනුවෙන් වරක් මුහම්මද් නබි (සල්) තුමාණන් සිය සගයින් අමතා පැවැසූහ. කියනු මැනැවැ යි, පැවැසූ විට "කෙනෙකු මිනිසුන්ට පෙන්වීමේ අදහසින් තමන්ගේ සලාතය අලංකාර කිරීමයි. (ඉමාම් අහ්මද් වාර්තා කරයි.)

අඡ් ෂිර්ක්, ලොකු ෂිර්ක් සහ කුඩා ෂිර්ක් වශයෙන් කොටස් දෙකකට පමණක් වර්ග කිරීමට හැක. සැඟවුනු ෂිර්ක් වර්ගය මෙම කොටස් දෙකට ඇතුලත් වේ.

වංචනිකයින්ගේ කුහක කම ලොකු ෂිර්ක් කොටසට ඇතුලත් වේ. මන්ද ඔවුහු යටි හිතින් අසත්‍ය ධර්මය රැදවාගෙන සිය

දිවියට බියෙන් මතු පිටින් පමණක් ඉස්ලාම් ප්‍රතිපත්තියක් අනුගමනය කරති.

අර් රියා හෙවත් ජනතාවගේ ආදරය හා විශ්වාසය දිනාගැනීමේ අදහසින් යහකම් කිරීම කුඩා ෂිර්ක් කොටසට අයත් වේ. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මහ්මූද් බින් ලබීද් අල් අන්සාරී තුමා දැනුම් දෙන හදීසයෙහි සහ අබී සර්ද් තුමා දැනුම් දෙන හදීස්හි සඳහන් වී ඇත. අල්ලාහ් අප සැමට සුමග පෙන්නුම් කරත්වා!

**පාඩම අංක : 5**

## ඉස්ලාමයේ කුළුණු (වගකීම්) පහ

පළමුව අල්ලාහ් තආලා හැර වන්දනා මානය කිරීමට වෙනත් කිසිවක් හා කිසිවෙකු නොමත මුහම්මද් නබි (සල්) තුමාණන් අල්ලාහ්ගේ දූතයකු බවට සාක්ෂි දැරීම. දෙවනුව සලාත් ඉටු කිරීම. තෙවනුව සකාත් ප්‍රධානය කිරීම. සිව්වැනි වගකීම රමධාන් මාසයේදී උපවාස ශීලයේ නිරත වීම. පස්වැනි වගකීම නම් හැකියාවක් ඇති අය

අල්ලාහ්ගේ ශුද්ධ වූ නිවසට ගොස් හජ් වගකීම ඉටු කිරීමයි.

**පාඩම අංක : 6**

**සලාතය සඳහා කොන්දේසි**

ඉස්ලාම්, මනා අවබෝධයකින් යුක්ත වීම, නිසි වයසට පත් වී සිටීම, මහ කිල්ලෙන් හා සුළු කිල්ලෙන් මිදීම, අපවිත්‍ර දෑ ඉවත් කිරීම, උචිත වස්ත්‍රයකින් සැරසී සිටීම, සලාතය සඳහා නිසි කාල වේලාව පැමිණීම, කිබ්ලා දෙසට මුහුණලා සිටීම, චේතනාව ඇති කර ගැනීම,

**පාඩම අංක : 7**

**සලාතයේ (රුකුන්) ස්තම්භ දාහතරකි.**

සවිය ඇත්නම් සිටගෙන සලාත් කිරීම, තක්බීර් තහ්රීම් පැවැසීම, ෆාතිහා සූරාව පාරායනය කිරීම, රුකූඋ කිරීම, රුකූඋ සිට පැමිණීම, අවයව හතක් මුල් කරගෙන සුජූද් කිරීම, සුජූද් සිට පැමිණීම, සුජූද් දෙක අතර ස්වල්ප මොහොතක් වාඩි වී සිටීම,

රුකූන් තත්ත්වටය පැමිණි සෑම අවස්ථාවකම සුළු මොහොතක් හෝ රැඳී සිටීම, පිළිවෙලකට කිරීම, තෂහ්හුදය සඳහා වාඩි වීම, තෂහ්හුද් පාරායනය කිරීම, නබි (සල්) තුමාණන්ගේ නාමයෙන් සලවාත් කීම, සලාම් දීම,

**පාඩම අංක : 8**

## <u>සලාතයේ අනිවාර්ය ක්‍රියා</u>

1. පළමු තක්බීරය හැර සලාතයේ විවිධ අවස්ථාවන්හිදී පවසන සියළු <u>තක්බීරයන්.</u>

2. ඉමාම් හෝ මුන්ෆරිද් තත්ත්වයේ සිටින කෙනෙකු سمع الله لمن حمده

"අල්ලාහ් ඔහුව ප්‍රශංසා කරන පුද්ගලයාට සවන් දෙමින් සිටී" යනුවෙන් කීම.

3. රුකූඋ තත්ත්වයේ සිට නැගිට සිටින විට

ربنا لك ولك الحمد

(අපේ ශ්‍රේෂ්ඨ අධිපතියාණෙනි) සියළු ප්‍රශංසා ඔබටම හිමිවේ.) යනුවෙන් කිව යුතුයි

4. රුකූඋ අවස්ථාවේදී سبحان ربي العظيم (මගේ

උතුම් දෙවියනි ,ඔබගේ ශ්‍රේෂ්ඨත්වය වර්ණනා කරමි.) යනුවෙන් උසරිය යුතුයි.

5. සුජූද් අවස්ථාවේදී سبحان ربي الأعلى උත්තරීතරවූ මගේ දෙවියා සුවිශුද්ධවේ) යනුවෙන් කීම.

6. සජ්දා දෙක අතර (رب اغفر لي) යනුවෙන් කීම.

7. පළමු තෂහ්හුදය පාරායනය කිරීම.

8. තෂහ්හුද් සඳහා ඉඳ ගැනීම.

**පාඩම අංක : 9**

සලාතයේදී තෂහ්හුද් පැවැසීම

පළමු කොටස:- "***අත්තහියියාතු ලිල්ලාහි වස්සලවාතු වත්තය්යිබාතු අස්සලාමු අලෙයික අයියුහන් නබියියු වරහ්මතුල්ලාහි වබරකාතුහු අස්සලාමු අලෙයිනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන්. අෂ්හදු අන්ලා ඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු.***"

**පරිවර්තනය :**

සියලු පුද පඬුරුද සශ්‍රීත වූ දේවල්ද, සලාතයන්ද අල්ලාහ්ටම අයිතිවේ. වක්තෘවරයාණෙනි! ඔබ තුමාට අල්ලාහ්ගේ කරුණාවද ආශිර්වාදයද ශාන්තියද හිමිවේවා!

අපටද යහපත් ගැතියන්ටද ශාන්තිය හිමි වේවා! වන්දනාමානය කිරීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැති බවට මම සාක්ෂි දරමි. ඇත්ත වශයෙන්ම මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා අල්ලාහ්ගේ ගැත්තා සහ වක්තෘවරයාණන් යැයිද මම සාක්ෂි දරමි.

දෙවනි කොටස "***අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද් අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජීද්.***"

**පරිවර්තනය :**

යා අල්ලාහ්! ඉබ්රාහීම් (අලෛයි) තුමා හා එතුමාගේ පවුලේ අය වෙත කරුණාව දැක්වූවාක් මෙන් මුහම්මද් (සල්) තුමා වෙත හා එතුමාගේ පවුලේ අය වෙත කරුණාව දක්වන්න. ස්ථිර වශයෙන් ඔබටය සියලු ප්‍රශංසාවන් හා ශ්‍රේෂ්ඨත්වයන් හිමි වන්නේ. යා අල්ලාහ්! ඉබ්රාහීම් (අලෛයි) තුමා හා එතුමාගේ පවුලේ අය කෙරෙහි ආශිර්වාදය කළා මෙන් මුහම්මද් (සල්) තුමා වෙත හා එතුමාගේ පවුලේ අය කෙරෙහි

ආශිර්වාදය කරන්න. ස්ථිර වශයෙන්ම ඔබටය සියලු ප්‍රශංසාවන් හා ශ්‍රේෂ්ඨත්වයන් හිමිවන්නේ.

## දුආ ප්‍රාර්ථනා

**" අල්ලාහුම ඉන්නී අඌදු බික මින් අදාබිල් කබ්රි, වමින් අදාබින් නාරි, වමින් ෆිත්නතිල් මහ්යා වල්මමාත්, වමින් ෆිත්නතිල් මසීහිද් දජ්ජාල් "**

**පරිවර්තනය :** අහෝ, අල්ලාහු තආලා මිනීවළෙහි සහ අපායේ දඬුවම් වලින්ද ජීවිතයේ සහ මරණයේ දුකින්ද දජ්ජාල් නම් සතුරාගේ හිරිහැරයෙන්ද මිදීමට ඔබේ පිහිට සොයමි.

පසුව එලොව වශයෙන් හා මෙලොව වශයෙන් සිය සිතුම් පැතුම් ඉටුකරගැනීම වස් අල්ලාහ් තආලාගෙන් ප්‍රාර්ථනා කළ හැක. සිය දෙමාපියන් වෙනුවෙන් හා පොදුවේ සියළුම මුස්ලිමුන් වෙනුවෙන්ද ප්‍රාර්ථනා කිරීමටද හැක. මේ සඳහා නබි කියමන්හි සාධක ඇත.

**පාඩම් අංක : 10**

<u>සලාතයේ සුන්නත් වූ පිළිවෙත්</u>

1. ආරම්භක (දුආ) ප්‍රාර්ථනය උසුරීම.

2. සලාතය සඳහා නැගිට සිටින අවස්ථාව, රුකූඋ තත්ත්වයට යාම, රුකූඋ තත්ත්වයේ සිට නැගිට සිටීම, යනාදී අවස්ථාවන්හිදී පපුව මත වම් අත මත තබා ඒ මත දකුණු අත තබා ගැනීම.

3. පහත සඳහන් අවස්ථාවන්හිදී ඇඟිලි විහිදෙන ආකාරයට දෙඅත් උරහිස දක්වා හෝ දෙකන්හි පහළ කොටස දක්වා හෝ එසවීම.

- ප්‍රථම තක්බීර් (තක්බීර් තහ්රීමා)
- රුකූඋ තත්ත්වයට යන විට
- රුකූඋ තත්ත්වයේ සිට පැමිණෙන විටදී

4. රුකූඋ හා සුජූද් අවස්ථාවේදී එක් වතාකට වඩා වැඩි වාර ගණනක් " තස්බීහ් " උසුරීම.

5. රුකූඋ තත්ත්වයේ සිට නැගිට සිටින අවස්ථාවේදී " රබ්බනා වලකල් හම්ද් " යනුවෙන් උසුරීමෙන් පසුව අතිරේක ප්‍රාර්ථනයන් උසුරීම. සජ්දා දෙක අතර "රබ්බිග් ෆිර්ලී" යන ප්‍රාර්ථනය උසුරීමෙන් පසු අතිරේක දුආ උසිරීම.

6. රුකුළ ඉරියව්වේදී හිස පිටකොන්දට සමාන තලයක පිහිටුවා ගැනීම.

7. සුජුද් අවස්ථාවේදී දෙඅත්හි ඉහළ කොටස දෙපැත්තෙන් ඈත් කොට තැබිය යුතු අතර උදරය කලවාවලින් නොදුරා දෙකලවා ළං නොවනසේ පුළුල්ව තබාගත යුතුයි.තවද දෙපා වකුටුකොට කලව පාදයෙහි පහළ කොටසෙහි නොගැවෙන සේ පිහිටුවා ගත යුතුයි.

8. දෙවැලම්ට පොළොවේ නොරැඳෙන සේ තරමක් ඔසවා තබා ගත යුතුයි.

9. සජ්දා දෙක අතර හා පළමු තෂහ්හුද් තත්ත්වයේ හිඳ ගැනීමේදී දෙපා නමා වම්පාදය උඩ ඉඳගෙන දකුණු පාදයෙහි ඇඟිලි බිම ගැවෙන පරිදි සිටවා ගැනීම.

10. රකඅත් තුනකින් හා හතරකින් සමන්විත සලාත්වලදී තෂහ්හුද් සඳහා වූ අවසාන ඉඳුමෙහි (තවර්රුක් ක්‍රමයට) හිඳ ගත යුතුයි.එසේ හිඳ ගන්නා ආකාරය මෙසේය. වම් පාදය දකුණු පසින් පිටට තබා වම් පාද කොටස සිටුවා පොළොවේ හිඳ ගත යුතුය.

දකුණු පාදය එහි ඇඟිලි බිම ගැටෙන පරිදි සිටවා ගත යුතුය.

11. පළමු තෂහ්හුද් සඳහා හිඳ ගැනීමේදී හා අවසාන හිඳුමේදී අල්ලාහ් සිහිකරන විට හා ප්‍රාර්ථනාකරන විටදී ඒකදේවවාදය සංකේතවත් කිරීම වස් දබරැඟිල්ලෙන් සංඥා කළයුතුයි.

12. පළමු තෂහ්හුද් අවස්ථාවේදී "ඉබ්රාහීම් නබි තුමාණන් වෙතද එතුමාගේ පරපුර වෙතද ශාන්තිය පිරිනමනු ලැබූ ආකාරයට මුහම්මද් නබි තුමාණන් වෙතද එතුමාගේ පරපුර වෙතද ශාන්තිය පිරිනමනු මැනව. තවද ඉබ්රාහීම් නබි තුමාණන් කෙරෙහිද එතුමාගේ පරපුර කෙරෙහිද ආශිර්වාද කළ ආකාරයට මුහම්මද් නබි තුමාණන් වෙතද එතුමාගේ පරපුර වෙතද ආශිර්වාදය කරනු මැනව යනුවෙන් ප්‍රාර්ථනා කිරීම.

13. අවසාන තෂහ්හුදයේදී අතිරේක ප්‍රාර්ථනයන් පාරායනය කිරීම.

14.පසහන සඳහන් සලාත්වලදී අල්කුආන් පාඨ ශබ්ද

නගා පාරායනය කිරීම. ෆජ්ර් සලාතය, මග්රිබ් සහ ඉෂා සලාතයන්හි පළමු රක්අත් දෙක, ජුම්ආ සලාතය, ඊද් සලාතය, ඉස්තිස්කා සලාතය,

15. පහත සඳහන් සලාත්වලදී අල්කුර්ආන් පාඨ නිශ්ශබ්දව පාරායනය කිරීම. ලුහර් සලාතය, අසර් සලාතය, මග්රිබ් සලාතයේ තෙවන රකඅතය, ඉෂා සලාතයේ අවසාන රක්අත් දෙක.

16. ෆාතිහා පරිච්ඡේදයට අමතරව වෙනත් අල්කුර්ආනයේ පාඨ පාරායනය කිරීම. රුකූඋ තත්ත්වයේ සිට නැගිට සිටින අවස්ථාවේදී

"රබ්බනා වලකල් හම්ද්" යනුවෙන් උසුරීමෙන් පසු ඉමාම්, මඃමූන්, හෝ මුන්ෆරිද් තත්ත්වයේ සිටින අය අතිරේක ප්‍රාර්ථනයන් උසුරීම.

**පාඩම අංක : 11**

## සලාතය නිෂ්ඵල කරන ක්‍රියා

සලාතය නිෂ්ඵල කරන ක්‍රියා අටකි. 1. සලාත් අවස්ථාවේදී කථා කිරීම. හිතාමතා කථා කිරීමෙන් සලාතය නිෂ්ඵල වන අතර අමතක වීමකින් හෝ නොදැනුවත් කමින් එසේ

කිරීමෙන් සලාතය අවලංගු නොවේ. **2.** සිනහව. 3. යමක් අනුභව කිරීම. 4. පානය කිරීම. 5. සලාතයේදී ශරීරය ආවරණය කර ගත යුතු ස්ථාන ආවරණය නොවීම. 6. කිබ්ලා දිසාවෙන් බැහැරව වෙනත් දිසාවකට හැරීම. 7. අනවශ්‍ය ලෙස අංග චලනය කිරීම. 8. වුළු නිෂ්ඵල කරන කරුණු එකක් හෝ සිදුවීම.

**පාඩම අංක : 12**

## වුළු සඳහා කොන්දේසි

ඉස්ලාම්, මනා අවබෝධයකින් යුක්ත වීම, නිසි වයසට පත් වී සිටීම, චේතනාව පිහිටුවීම, අදාල පිළිවෙත් පිළිබඳ දැනුම, ශාරීරික අවශ්‍යතා ඉටුකිරීමෙන් පසු වුළු කිරීමට පෙර ගල්කැට ආධාරයෙන් හෝ ජලය මගින් පිරිසිදු කර ගැනීම, පිරිසිදු ජලය, නිවැරදි (හලාල්) මාර්ගයෙන් ලබා ගත් ජලය, අදාල අවයවයන්හි ජලය නැවැරීම වළක්වාලන තීන්ත වැනි දෑ ඇලී ඇත්නම් ඒවා ඉවත් කිරීම, රෝගී තත්ත්වයන් නිසා නිතර කිළුටු තත්ත්වයට පත්වන අය සලාත් සඳහා නියමිත

වේලාව පැමිණීමෙන් පසු වුළු කිරීම,

**පාඩම් අංක : 13**

## වුළු සඳහා වූ අනිවාර්ය කරුණු හයකි.

1. මුහුණ සේදීම, (එනම් පළලින් කන් දෙක අතර කොටස සහ දිගින් නලලේ සිට නිකට දක්වා ඇති කොටස) ඒ සමගම ජලය ගෙන කට සේදීම, නාසය පිරිසිදු කිරීම, 2. දෙඅත් වැළමිට දක්වා සේදීම,3. හිස සම්පූර්ණයෙන්ම ජලයෙන් තැවරීම සහ දෙකන් පිරිසිදු කිරීම. 4. දෙපා වළලුකර දක්වා සේදීම. 5. පිළිවලින් කිරීම. 6. නොකඩවා කිරීම.

**පාඩම අංක : 14**

## <u>වුළු නිෂ්ඵල කරන ක්‍රියා</u>

ශරීරයේ ද්වාර මාර්ගයෙන් මල මූත්‍රා පහ කිරීම, ශරීරයෙන් අපවිත්‍ර දෑ පිටත් වීම, නින්ද නිසා හෝ වෙනත් හේතූන් නිසා සිහි කල්පනාව නැති වීම, ලිංගික ස්ථානය ආවරණයකින් තොර ස්පර්ශ කිරීම, ඔටු මස් අනුභව කිරීම,

ඉස්ලාමයෙන් ඉවත්වීම, මෙම තත්ත්වයෙන් අල්ලාහ් අප සැම ආරක්‍ෂා කරත්වා!

**සැළැකිය යුතුයි** : බොහෝ විද්වතුන්ගේ තීරණය අනුව දේහයක් දෝවනය කිරීම නිසා කෙනෙකුගේ වුළූ අවලංගු නොවේ. එසේ වුළූ අවලංගු වන බවට මූලික ග්‍රන්ථයන්හි සාධකද නොමත. නමුත් දේහයේ ලිංගික අවයවයෙහි දෝවනය කරන අයගේ අත් ආවරණයකින් තොරව ස්පර්ශය වීම නිසා ඔහු වුළූ කරගැනීම අනිවාර්ය වේ. එබැවින් දේහය දෝවනය කරන අය ආවරණයකින් තොරව එවැනි ස්ථාන සේදීම යුතු නොවේ.

කාන්තාවන් ස්පර්ශ කිරීම : මුහම්මද් නබි (සල්) තුමාණන් එතුමාගේ භාර්යාවට හාද්දක් දී ඉක්බිති සලාතය ඉටු කළහ. (හදීස්)

මෙම හදීසය අනුව කාමුක හැඟීමකින් යුතුව හෝ තොරව කාන්තාවක ස්පර්ශය කිරීම නිසා (ලිංගයෙන් ධාතු වැනි දියර පිටත් නොවන්නේ නම්) ඔහුගේ වුළූ අවලංගු නොවේ.

## أو لمستم النساء

ඔබලා කාන්තාවන් ස්පර්ශය කරන්නේ නම් (ඔබලා පිරිසිදු විය යුතුයි) අන් නිසා 34.

මෙම අල් කුර්ආන් පාඨය අනුව "කාන්තාවන් ස්පර්ශය කිරීම" යන්නෙහි අර්ථය ස්පර්ෂය කිරීම නොව කසාද භාර්යාවන් සමග සංසර්ගයේ යෙදීමයි. බොහෝ ඉස්ලාමීය විද්වතුන්ගේ තීරණයද මෙයයි. ඉබ්නු අබ්බාස් (රලි) තුමා සහ යහමග ගිය පැරැන්නන්ගේ පිරිසක් විසින්ද ඉහත සඳහන් අදහස ඉදිරිපත් කරඇත.දෙවියනි! අපට සුමග පෙන්වනු මැනව.

**පාඩම් අංක : 15**

## උසස් ගති ගුණ

සෑම මුස්ලිම් කෙනෙකු තුලම උසස් වූ ගති ගුණ වර්ධනය විය යුතුයි. සත්‍යවන්තභාවය, විශ්වාසවන්ත කම, විනීතභාවය, ලැජ්ජාව සහ බිය, උද්‍යෝගීතාව, දනට පිනට දීම, පොරොන්දු ඉටු කිරීම, අල්ලාහ් තආලා විසින් තහනම්

කරන ලද දෙයින් වැළැකී සිටීම, අසල්වැසියන් සමග සුහද සම්බන්ධතාවය, අපේ ශක්ති ප්‍රමාණයට අනුව නැති බැරි අයට උදව් උපකාර කිරීම, යනාදි වශයෙන් ශුද්ධ වූ අල්කුර්ආනයේ සහ මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ දේශනා තුල දක්නට ලැබෙන සියළුම උසස් ගුණ ධර්මයන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම.

**පාඩම් අංක : 16**

## ඉස්ලාමීය සමාජ සාර ධර්ම

එකිනෙකා අතර ශාන්තිය සමාදානය සලස්වාගැනීම අරඹයා සලාම් කියා ගැනීම, උදෙයාගිමත්භාවය, දකුණු අතින් කෑම අනුභව කිරීම, පානය කිරීම, වැඩක් ආරම්භ කිරීමේදී "බිස්මි" අල්ලාහ්ගේ නාමයෙනි යනුවෙන් පැවැසීම, වැඩක් අවසානයේදී "අල්හම්දු ලිල්ලාහ්" සියළු ප්‍රශංසා අල්ලාහ්ටම හිමි වේ, යැයි පැවැසීම, කිමුහුමකින් පසු අල්හම්දු

ලිල්ලාහ් යැයි පැවැසීම, කෙනෙකුට කිමුහුමක් යාමෙන් පසු අල්හම්දු ලිල්ලාහ් යැයි පැවැසූ විට ඉර්හමුකල්ලාහ් යනුවෙන් ආශිර්වාදය පැතීම, රෝගාතුරවූ කෙනෙකුගේ ලෙඩ දුක් විමසීමට යාම, කෙනෙකු මරණයට පත් වූ විට ජනාසා සලාත්, භූමදානය වැනි ඔහුගේ අවසන් කටයුතු වලට සහභාගි වීම, මස්ජිදයට ඇතුල්වීමේදී හා පිටවීමේදී, නිවසට ඇතුල්වීමේදී හා පිටවීමේදී, ගමන් බිමන් වලදී ඉස්ලාමීය වත්පිළිවෙත් ඉටුකිරීම, දෙමව්පියන්, පවුලේ ඥාතීන්, හිතමිතුරන් හා අසල්වැසියන් වෙනුවෙන් ඉටුකල යුතු යුතුකම් නිසියාකාරව ඉටු කිරීම. වයසින් වැඩි අයට ගරුකිරීම, වයසින් අඩු අයට ආදරය කිරීම, කෙනෙකුට දරු සම්පතක් ලැබුනු විටක සුභ පැතීම, විවාහ මංගල්‍ය උත්සවයකදී යුවලට ආශිර්වාදය පැතීම, කෙනෙකුගේ දුකේදී සහයෝගය දැක්වීම, ඇඳුම් ඇඳීම, පාවහන් පැළැඳීම, යනාදියේදී

පවා ඉස්ලාමීය වත්පිළිවෙත් අනුගමනය කිරීම.

**පාඩම් අංක : 17**

**<u>පාපිෂ්ඨ හා ෂිර්ක් ක්‍රියාවෙන් වැළැකී සිටීම</u>**

විවිධ පාපිෂ්ඨ හා ෂිර්ක් ක්‍රියාවන්ගෙන් වැළැකී සිටීම, විශේෂයෙන්ම හදීසයේ සඳහන් වන ආකාරයට කෙනෙකුට විනාශය ගෙන දෙන කරුණු හතකින් වැළැකී සිටීම, ඒවා නම් : අල්ලාහ්ගේ බලමහිමයටසමානතැබීම, කොඩිවින හා ගුරුකම්කිරීම්,අසාධාරන ලෙස කෙනෙකුගේ ජීවිතය විනාශ කිරීම, පොලියට දීම, පොලියට ගැනීම, හා ඒවායින් යැපීම, අනාතයින්ගේ සම්පත් ගසා කෑම, ජනතාවගේ විමුක්තිය සඳහා සටන් කරමින් සිටිනා විටදී යුද පිටියෙන් පලායාම, විශ්වාස වන්ත යහපත් කාන්තාවන් අපලාදයට හා අපවාදයට ලක් කිරීම.

තවද දෙමව්පියන්ට හිරිහැර කිරීම හා නොසැළැකිම, ඥාති හිතවතුන් ගේ

සම්බන්ධතාවය නැති කරගැනීම, අසත්‍ය ප්‍රකාශය, අසත්‍ය ලෙස දිව්රුම් දීම, අසල්වැසියන්ට හානි පමුණුවීම, මිනිසුන්ගේ ජීවිතයට හානි සිදුකිරීම, ඔවුන්ගේ මිළමුදල් හා දේපොළ සම්පත් වංචා ලෙස ලබා ගැනීම, මත් පැන් පානය කිරීම, සූදුව, සූරාව, කේලම් කීම, ඕපාදූප කථා කිරීම, යනාදි දුර්ගුණයන් ගෙන් වැළැකී සිටීම. තවද අල්ලාහ් තආලා විසින් සහ ඔහුගේ රසූල් විසින් තහනම් කරන ලද දෙයින් වැළැකී සිටීම.

**පාඩම් අංක : 18**

## <u>මියගිය මුස්ලිම් කෙනෙකු වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම්.</u>

### <u>මරණාසන්නව සිටින මොහොත</u>

කෙනෙකු මරණාසන්නව සිටින මොහොතක ඔහුට "ලාඉලාහ ඉල්ලල්ලාහ්" යන කලිමා කියා දිය යුතුය. නබි (සල්) තුමාණන් මේ

ගැන මෙසේ පැවැසූහ.

" لقنوا موتاكم : لاإله إلاالله "

මරණාසන්නව සිටින කෙනෙකුට " ලාඉලාහ ඉල්ලල්ලාහ්" යන කලිමා කියා දෙන්න. (ග්‍රන්ථය මුස්ලිම්)

"මව්තා" යන වචනයේ අර්ථය මරණ අභියස සිටින්නා යන්නයි.

<u>කෙනෙකු මිය ගිය වහාම කළ යුතු යුතුකම්.</u>

කෙනෙකු මිය ගිය බව ස්ථිර වූ වහාම දේහයේ දෑස් වසා හක්ක (විවෘතව නොපවතින පරිදි) ගැට ගසා ගැනීම. මෙම ක්‍රමය සඳහා සුන්නාවෙහි සාධක ඇත.

තෙවනුව: මුස්ලිම් කෙනෙකුගේ දේහය දෝවනය කිරීම අනිවාර්ය වේ. ෂහීද් වශයෙන් යුද පිටියේ මියගිය කෙනෙකු නම් ඔහුගේ දේහය දෝවනය කිරීම හෝ සලාත් ඉටු කිරීම අවශ්‍ය නොවේ. ඔහු ඇඳ සිටි වස්ත්‍රය පිටින්ම මිහිදන් කරනු

ලැබේ. මන්ද උහද් යුද පිටියේදී මිය ගිය සහාබා සෙබළුන් වෙනුවෙන් මුහම්මද් නබි (සල්) තුමාණන් ජනාසා සලාත් ඉටු කළේ නැත.

<u>දේහය දෝවනය කළයුතු ආකාරය</u>

පළමුව දේහයේ ලිංගික අවයව ප්‍රදේශ වස්ත්‍රයකින් ආවරණය කළ යුතුයි. පසුව දේහයේ කඳකොටස මදක් ඔසවා උදරය ඔබා අපවිත්‍ර දෑ ඉවත් කළ යුතුය. දේහය දෝවනය කරන්නා විසින් (ග්ලව්ස්) අත්වැසුම් පැළැඳගෙන දේහයෙන් පිට වූ අපවිත්‍ර දෑ ඉවත් කර දේහය පිරිසිදු කර ගත යුතුය. පසුව සලාතයක් සඳහා වුළූ කරන ආකාරයට දෝවනය කරන්නා විසින් දේහයට වුළූ කරවීමෙන් පසු දේහය සම්පූර්ණයෙන් පිරිසිදු කිරීම ආරම්භ කළ යුතුයි. පසුව මසං කොළ භාවිතයෙන් හෝ සබන් භාවිතයෙන් හිස සහ රැවුල සේදිය යුතුයි. පසුව මෘත ශරීරයේ දකුණු පැත්ත පළමුවද වම් පැත්ත දෙවනුවද සේදිය යුතුයි. මේ ආකාරයට දේහය දෙවතාවක්

හෝ තුන් වතාවක් සේදිය යුතුයි. ඒ සෑම මොහොතකම දෝවනය කරන්නා තම අතින් දේහයේ උදරය තෙරපිය යුතු අතර අපවිත්‍රයක් පිට වූ විට එම ස්ථානය හොඳින් සේදිය යුතුය. අපවිත්‍ර දෑ පිටත් වන ද්වාරය පුළුන් හෝ ඒ හා සමාන දෙයකින් වැසිය යුතුයි. වැසිය නොහැකි නම් (පැරණි ක්‍රම අනුව) මැටි භාවිතයෙන් හෝ නවීන වෛද්‍ය ක්‍රම අනුව ප්ලාස්ටර් වැනි දෙයක් ආධාරයෙන් එම ස්ථාන වැසිය යුතුයි.

මෘත ශරීරය සඳහා නැවැත වුදු කරවිය යුතුයි. දේහය එක් වරක් හෝ දෙවරක් සේදීම ප්‍රමාණවත් නොවේ නම් තුන් වරක්, පස් වරක්, හෝ හත් වරක් සේදීමට හැක. පසුව පිරිසිදු රෙදි කැබැල්ලකින් දේහය පිස දැමිය යුතුයි. නළල් තලයෙහි සහ ශරීරයේ රහස් පෙදෙස්හි සුවඳ විලවුන් ආලේප කළ යුතුයි. මෘත ශරීරය සම්පූර්ණයෙන්ම සුවඳ නැවැරීම වඩාත් යෝග්‍ය වේ. කෆන් රෙදි සඳුන් දුමින් සුවඳවත් කළ

යුතුයි. මෘත ශරීරයේ නියපොතු සහ උඩු රැවුල පමණට වඩා වැවී ඇත්නම් ඒවා අඩු කළ හැක. මූලික ග්‍රන්ථවල සාධක නැති බැවින් රහස් ස්ථානයන්හි ඇති රෝම ඉවත් නොකළ යුතු අතර හිස පීරිය යුතුද නොවේ. මෘත දේහය කාන්තාවකගේ නම් කොන්ඩය කරල් තුනකට ගොතා පිටුපසින් මතාතැබිය යුතුය.

## දේහයට ඇඳුම් අන්දවන ක්‍රමය

පිරිමියෙකුගේ දේහය රෙදි කැබැලි තුනකින් ආවරණය කළ යුතුයි. මෙයට කමීසයක් හෝ තලප්පාවක් ඇතුලත් නොවේ. මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ දේහය ආවරණය කරන ලද්දේ මේ ආකාරයටයි. කමීසයකින් හා වේට්ටියකට සමාන රෙද්දක් අන්දවා දේහය සම්පූර්ණයෙන් රෙදි කැබැල්ලකින් ආවරණය කිරීමද නිවරදි ක්‍රමය වේ. කාන්තාවක් සඳහා රෙදි කැලි පහක් අවශ්‍ය වේ. සාමාන්‍ය රෙදි කැබැල්ලක්, වෙල් රෙද්දක්, ඉනට පහලික්

එතීමට රෙද්දක්, දේහය සම්පූර්ණයෙන් එතීමට රෙදි කැබැලි දෙකක්. දරුවන් සඳහා රෙදි කැබැලි එකේ සිට තුනක් දක්වා භාවිතා කළ හැක. ළදරුවකු සඳහා කමිසයක් අන්දවා රෙදි කැබැලි දෙකකින් එතිය යුතුයි.

සියළුම මෘත ශරීර සඳහා අවම වශයෙන් එක ඇඳුමකින් හෝ කෆන් කිරීම අනිවාර්යය වේ. ඉහ්රාම් තත්ත්වයේ සිටියදී කෙනෙකු මිය ගිය විට සමාන්‍ය ජලයෙන් හා මසංකොල මිශ්‍ර ජලයෙන් දෝවනය කළ යුතුයි. ඔහු ඇඳ සිටි ඉහ්රාම් රෙදි කැබැලි දෙකෙන් හෝ වෙනත් රෙදි කැබැලි දෙකකින් එතිය යුතුයි. දේහයේ හිස සහ මුහුණ ආවරණය කරන්නේ නැත. සුවඳ විලවුන් ආලේප කරන්නේද නැත. මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ හදීසයක මෙසේ සඳහන් වී ඇත.

لأنه يبحث يوم القيامة ملبيا

(ඉහ්රාම් තත්ත්වයේ සිටියදී මිය ගිය

තැනත්තා) තල්බියා පාඨය කියන තත්ත්වය යටතේ අවසන් දිනයේදී නැගිටුවනු ලබයි.

ඉහ්රාම් තත්ත්වයේ සිටි කාන්තාවක් මිය ගිය විටක සාමාන්‍ය ආකාරයට කෆන් කළ යුතුයි. සුවඳ විලවුන් ආලේප කරන්නේ නැත. අත් වැස්මෙන් දෙඅත් හෝ සාළුවෙන් මුහුණ හෝ ආවරණය නොකළ යුතුයි. නමුත් ඇයගේ අත් සහ මුහුණ දේහය මතින රෙද්දෙන් ආවරණය කළ යුතුයි.

## මෘත ශරීරය දෝවනය කිරීම සහ ජනාසා සලාතය මෙහෙයවීම සඳහා සුදුසු පුද්ගලයන්

**සලාතය, දෝවනය, මිහිදන්, කිරීම** යනාදිය සඳහා ශරීආ නීතියට අනුකූලව මියගිය තැනැත්තා විසින් සිය අවසාන කැමැති පත්‍රයෙහි නම් කර ඇත්තේ කව්රුන්ද ඔවුහු මේ සඳහා සුදුසු කම් ලබති. ඉන්පසු පිළිවලින් පියා, සීයා, ඉනා සමීප ඥාතීන්. මේ සඳහා සුදුසු කම් ලබති.

**ස්ත්‍රියක් දෝවනය කිරීම සඳහා** ඇය විසින් සිය අවසාන කැමැති පත්‍රයෙහි මේ කටයුතු සඳහා නම් කර ඇත්තේ කව්රුන්ද ඔවුහු මේ සඳහා සුදුසු කම් ලබති. ඉන් පසු මැතියන්, මිත්තතියන්, ඥාතීන් (කාන්තාවන්) ආදි වශයෙන් සුදුකම් ලබති. ස්වාමි පුරුෂයාට සිය බිරිඳ දෝවනය කිරීමට හා බිරිඳට සිය ස්වාමි පුරුෂයා දෝවනය කිරීමට ශරීආ නීතියෙන් අවසර ඇත. අබූ බක්ර් (රලි) තුමානන්ගේ දේහය දෝවනය කරන ලද්දේ එතුමාගේ බිරිඳ විසින්ය. ෆාතිමා (රලි) තුමියගේ දේහය දෝවනය කරන ලද්දේ ඇයගේ ස්වාමි පුරුෂයා වූ අලි (රලි) තුමාණන් වසින්ය.

## ජනාසා සලාත් ඉටු කරන ආකාරය

මෙම සලාතය තක්බීර් හතරකින් සමන්විතය. පළමු තක්බීරයෙන් පසු සූරතුල් ෆාතිහා පාරායනය කළ යුතුයි. ඒ සමග කෙටි සූරතයක් හෝ අල්කුර්ආනයෙන් පාඨයක් හෝ දෙකක් පාරායනය කළ හැක. ඉබ්නු අබ්බාස්

(රලි) තුමා වාර්තා කරන හදීසයක මේ සඳහා සාධක ඇත. දෙවන තක්බීරයෙන් පසු තෂහ්හුදයේදී උසුරනු ලබන ආකාරයට මුහම්මද් නබි (සල්) තුමා කෙරෙහි සලවාත් කිව යුතුයි. පසුව තෙවන තක්බීරයෙන් පසු මිය ගිය අය සඳහා (දුආ) ප්‍රාර්ථනා කළ යුතුය. එනම්:

**"අල්ලාහුම්මග් ෆිර් ලි හයියිනා ව මයියිතිනා, ව ෂාහිදිනා ව ගාඉබිනා ව සගීරිනා ව කබීරිනා ව දකරිනා වඋන්සානා අල්ලාහුම්ම මන් අහ්යයිතහු මින්නා ෆඅහ්යිහි අලල් ඉස්ලාම් වමන් තවෆ්ෆයිතහු ෆතවෆ්ෆිහි අලල් ඉස්ලාම්."**

යා අල්ලාහ්! අප අතරින් ජීවතුන් අතර සිටින අයගේද, මිය ගිය අයගේද, මේ අවස්ථාවේදී අප සමග සහභාගි වී සිටින අයගේද, සහභාගි නොවූ අයගේද, වයසින් ළමාවියේ පසුවන අයගේද වයසින් වැඩිහිටි අයගේද පුරුෂ පක්ෂයේද ස්ත්‍රී පක්ෂයේද වැරදි සමා

කරනු මැනව! යා අල්ලාහ් ඔබ අප අතරින් කෙනෙකුව ජීවත් කරවන්නේ නම් ඔවුන් ඉස්ලාමය වෙනුවෙන් ජීවත් කරවන්න. ඔබ කෙනෙකුව මරණයට පත් කරවන්නේද ඔහු ඊමාන් තත්ත්වය යටතේ මරණයට පත් කරවන්න.

**"අල්ලාහුම්මහ් ෆිර්ලහු වර්හම්හු වආෆිහි වඅෆු අන්හු වඅක්රිම් නුස්ලහු වවස්සිහ් මද්හලහු වහ්සිල්හු බිල්මාඉ වස්සලජී වල්බර්දි වනක්කිහි මිනල් හතායා කමා යුනක්කිස් සව්බුල් අබ්යදු මිනද් දනස්. වඅබ්දිල්හු දාරත් හයිරත් මිත් දාරිහි වජ්වාරත් හයිරත් මිත් ජවාරිහි වඅද්හිල්හුල් ජත්තත වඅද්දිහි මිත් අදාබිල් කබ්රි වමිත් අදාබිත් තාර් වෆ්සහ් ලහු ෆී කබ්රිහි වනව්විර් ලහු ෆීහි අල්ලාහුම්ම ලා තහ්රිම්නා අජ්රහු වලා තුදිල්නා බඅ්දහු."**

යා අල්ලාහ් මිය ගිය අයගේ වැරදි සඳහා සමාව දෙන්න. ඔහුට ආදරය කරුනාව දක්වන්න. ඔහු ප්‍රවිශ්ට වන ස්ථානය අලංකාර කරන්න. ඔහු ජලයෙන්ද, සිසිල් ජලයෙන්ද, සිසිල් කැටයෙන්ද පවිත්‍ර කරන්න. සුදු

වස්ත්‍රයක කිළිටු ඉවත් කරන්නේ යම් සේද එසේම ඔහුගේ වැරදි සඳහා සමාව දෙන්න. ඔහුට විශිෂ්ට වාසස්ථානයක් ලබා දෙන්න. හොඳ අයගේ ඇසුර ලබා දෙන්න. ඔහු ස්වර්ගයට ඇතුල් කරවන්න. නිරයේ වෙදනාවෙන් සහ මිනී වලේ වේදනාවෙන් ආරක්ෂා කරන්න. ඔහුගේ මිනී වල පුළුල් කරන්න. එය ආලෝකමත් කරන්න. යා අල්ලාහ් ඔහු විසින් රැස් කළ යහකම් විනාශයට පත් නොකරන්න. ඔහුගේ මරණයෙන් පසු අප නොමග නොයවන්න.

ඉක්බිති සිව්වැනි තක්බීරයට පසුව සලාම් කිව යුතුයි. සෑම තක්බීරයක් අතර දෙඅත් උරහිස දක්වා හෝ දෙකන්හි යට කොටස දක්වා එසවීම සුන්නත් වේ. මෘත ශරීරය කාන්තාවකගේ නම් "අල්ලාහුම්මහ් ෆිර් ලහා" යනුවෙන්ද, මෘතශරීරදෙකක් නම් "අල්ලාහුම්මඃහ් ෆිර් ලහුමා" යනුවෙන්ද, මෘත ශරීර දෙකකට

වඩා වැඩි සංඛ්‍යාවක් ඇත්නම් "අල්ලාහුම්මඃ ෆිර් ලහුම්" යනුවෙන් (අරාබි භාෂාවේ ව්‍යාකරණයට අනුකූලව වචන ගලපා ප්‍රාර්ථනා කළ යුතුයි.)

මෘත ශරීරය ළදරුවෙකුගෙ නම් පහත සඳහන් ආකාරයට ප්‍රාර්ථනා කළ යුතුයි.

යා අල්ලාහ් දෙමව්පියන්ව ස්වර්ගයේදී පිළිගන්නා වූ දරුවන් බවට පත්කරන්න. යා අල්ලාහ් ඔබ ඉදිරියේ සිය දෙමව්පියන් වෙනුවෙන් කතා කරන දරුවෙකු බවට පත් කරන්න. මෙම ළදරුවා මුල් කරගෙන දෙමව්පියන්ගේ යහකම් බඳුනෙහි බර වැඩි කරන්න, ඔවුන්ගේ සත් ක්‍රියා විශිෂ්ඨත්වයට පත් කරන්න. පෙරවිසූ යහපත් විශ්වාස වන්තයින්ගේ කණ්ඩායමට මොහු ඇතුලත් කරන්න. ඉබ්රාහීම් (අලෛ) තුමාණන්ගේ අනුග්‍රහය ලබා දෙන්න. නිරයේ වේදනාවෙන් මෙම දරුවා රැක දෙන්න.

## ජ.සලාතයේදී මෘත ශරීර තබා ගන්නා පිළිවෙත්.

ඉමාම් පිරිමියකුගේ හිසට සහ කාන්තාවකගේ ඉනට කෙලින් සිටගැනීම සුන්නත් වූ ක්‍රමයයි. මෘත ශරීර ගණනාවක් තිබෙන විටක අනුගමනය කළ යුතු ක්‍රමය නම් පිරිමියෙකුගේ දේහය ඉමාම් ඉදිරියෙන්ද, පිරිමියෙකුගේ දේහය ඉදිරියෙන් කාන්තාවකගේ දේහයද තැන්පත් කර ගැනීම නිවරදි පිළිවෙතයි. පිරිමි දරුවන්ගේ මෘත ශරීර ඇත්නම් පිරිමින්ගේ දේහය ඉදිරියෙන් පිරිමි දරුවන්ගේ දේහයද ඉන්පසු කාන්තාවන්ගේ දේහයද කාන්තාවන්ගේ දේහය ඉදිරියෙන් ගැහැණු දරුවන්ගේ දේහයද තබා ගත යුතුයි. පිරිමි දරුවන්ගේ හිස පිරිමි දේහයේ හිසට සමානවද, කාන්තාවකගේ ඉන කොටස පිරිමියකුගේ හිසට කෙළින්ද, පිහිටන සේ තබා ගත යුතුයි. එසේම ගැහැණු දරුවකුගේ හිස කාන්තාවකගේ හිසට සමානවද ඉන කොටස පිරිමියකුගේ හිසට

කෙලින්ද පිහිටන සේ පිළිවලින් තැන්පත් කර තබා ගැනීම නිවරදි ක්‍රමය වේ. ජනාසා සලාතය ඉටු කරන සියළු දෙනාම ඉමාම් පිටු පස පෙළ ගැසී සිට ගැනීම අවශ්‍ය වේ. ජනාසා සලාතය ඉටුකරන කෙනෙකුට ඉමාම් පිටුපස සිටගැනීමට ඉඩක් නැත්නම් පමණක් ඉමාම්ගේ දකුණු පෙදෙසෙහි සිටගෙන් සලාතය ඉටු කළ හැක.

وصلى الله على سيدنا محمد وآله وصحبه وسلم

අල්ලාහ් මහුගේ පණිවිඩකරු හා සේවකයෙකුවූ මුහම්මද් (සල්) තුමාණන් හා එතුමාගේ පවුලේ ඥාතීන් වෙතද එතුමාගේ මිතුරන් වෙතද් මෛත්‍රිය හා ශාන්තිය පුද කරත්වා!

*************

# الدروس المهمة لعامة الأمة

تأليف سماحة العلامة:

عبدالعزيز بن عبدالله بن باز رحمه الله

ترجمه للغة السنهالية :

محمد نظيم عز الدين

مركز العناية بالمسلمين الجدد

# الدروس المهمة لعامة الأمة

تأليف سماحة العلامة:

عبدالعزيز بن عبدالله بن باز

ترجمه للغة السنهالية :

محمد نظيم عز الدين

مطبعة دار طيبة - الرياض - ت: ٤٢٨٣٨٤٠

المكتب التعاوني للدعوة والإرشاد
بالصناعية الجديدة
**مركز العناية بالمسلمين الجدد**
هاتف: ٢٤٢٣٠٠٨ - فاكس: ٢٤٢٣٠٠١
ص.ب ٤٣٣٣٩ الرياض ١١٥٦١
حساب رقم: ١٤٤٠١/١ فرع ٢٨٢
شركة الراجحي المصرفية

The Cooperative Office for Call & Guidance at the Industrial Area
***Care Center for New Muslims***
Tel: 2423008 - Fax: 2423001
P.O.Box: 43339 Riyadh 11561

**www.alenayah.com**